# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1899/41 - 2015 ජනවාරි මස 30 වැනි සිකුරාදා- 2015.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ (1) හා (5) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව 2015.01.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාතේ පළාත් සභාව සඳහා පහත සඳහන් පත්කිරීම් කර ඇති බව ඌව පළාත් ආණ්ඩුකාරවර එම්. පී. ජයසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

| | | | |
|---|---|---|---|
| 01. | ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා | - | ඌව පළාතේ පළාත් සභාවේ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සමාජ සුබසාධන ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රවාහන හා ඉදිකිරීම් අමාත්‍යවරයා වශයෙන්, |
| 02. | ඌව පළාතේ පළාත් සභාවේ ගරු මන්ත්‍රී අනුර රවීන්ද්‍ර විදානගමගේ මැතිතුමා | - | ඌව පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, මිරිදිය ධීවර කර්මාන්ත, ඉඩම් හා සංචාරක කටයුතු අමාත්‍යවරයා වශයෙන්, |
| 03. | ඌව පළාතේ පළාත් සභාවේ ගරු මන්ත්‍රී ජයසුන්දර මුදියන්සේලාගේ ආනන්ද කුමාරසිරි මැතිතුමා | - | ඌව පළාතේ පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන්, |
| 04. | ඌව පළාතේ පළාත් සභාවේ ගරු මන්ත්‍රී රවීන්ද්‍ර සමරවීර මැතිතුමා | - | ඌව පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, සමුපකාර, සත්ව නිෂ්පාදන හා සංස්කෘතික අමාත්‍යවරයා වශයෙන්, |
| 05. | ඌව පළාතේ පළාත් සභාවේ ගරු මන්ත්‍රී වඩිවේලු සුරේස් මැතිතුමා | - | ඌව පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා, යෞවන කටයුතු, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත, වතු යටිතල පහසුකම් හා වතු අධ්‍යාපන කටයුතු අමාත්‍යවරයා වශයෙන්. |

**එම්. පී. ජයසිංහ,**
ඌව පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවර.

2015 ජනවාරි මස 30 වැනි දින,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

02-439

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 2354—52 (2015/01)